රුහුණ විශ්වවිද්‍යාලය

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

පළමු සමාසික පරීක්ෂණය - 2017 සැප්තැම්බර්

**MAE 5100 - සූක්ෂ්ම ආර්ථික න්‍යාය**

UNIVERSITY OF RUHUNA LIBRARY - MATARA 25 FEB 2020

<u>එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින් තෝරාගෙන</u> ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න.

කාලය: පැය 03 යි.

**ගණක යන්ත්‍ර භාවිතයට අවසර නැත.**

---

## <u>(අ) කොටස</u>

01. ආහාර සහ ඇඳුම් යන භාණ්ඩ දෙක නිමල් මිලයට ගනියි. තවද ඇඳුම් වෙනුවට ආහාර ආදේශනය කිරීමේ ආන්තික ආදේශන අනුපාතිකය අඩු වෙමින් පවතී. පරිභෝජනය කරන ආහාර ප්‍රමාණය <u>x</u> වශයෙනුත් පරිභෝජනය කරන ඇඳුම් ප්‍රමාණය <u>y</u> වශයෙනුත් සලකන්න. ආහාරවල මිල $P_{x1}$ සිට $P_{x2}$ දක්වා ඉහළ නගින බව ද සලකන්න. පහත සඳහන් තත්ත්වයන් යටතේ මිල වෙනස්වීම නිසා ආහාර පරිභෝජනය මත ඇතිවන ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක ප්‍රස්තාර සටහනක පැහැදිලි ව දක්වා නම් කරන්න.

(අ) ආහාර සාමාන්‍ය භාණ්ඩයක් වීම. (ලකුණු 03)

(ආ) ආහාර සඳහා ආදායම් ඉල්ලුම් නම්‍යතාව ශූන්‍ය අගයක් ගැනීම. (ලකුණු 04)

(ඇ) ආහාර බාල භාණ්ඩයක් වීම. (ගිෆන් භාණ්ඩයක් නොවේ.) (ලකුණු 04)

(ඈ) ආහාර ගිෆන් භාණ්ඩයක් වීම. (ලකුණු 04)

02. කොබ් - ඩග්ලස් නිෂ්පාදන ශ්‍රිතයක් පිළිබඳව

(අ) L, K, ∝ සහ β සංකේත යොදා ගනිමින් අදාළ සූත්‍රය දක්වා, ඒ එක් එක් සංකේතයන් මඟින් පිළිඹිබු කෙරෙන ආර්ථික අර්ථ කථනය පෙන්වා දෙන්න.

(ලකුණු 03)

(ආ) කොබ් - ඩග්ලස් නිෂ්පාදන ශ්‍රිතයක ප්‍රධාන ගුණාංග හා සීමාකම් කවරේ ද?

(ලකුණු 04)

(ඇ) ශ්‍රමයේ මුළු නිෂ්පාදනය ($TP_L$), සාමාන්‍ය නිෂ්පාදනය ($AP_L$) හා ආන්තික නිෂ්පාදනය ($MP_L$) පෙන්නුම් කරන වක්‍ර අඳින්න.

(ලකුණු 04)

(ඈ) $\alpha = 1.5$ ක් ද $\beta = 0.5$ ක් ද වන විට $Q = 100$ සහ $Q = 400$ සහිත සම නිෂ්පාදන වක්‍ර සිතියමක ප්‍රසාරණ මාර්ගය පෙන්වා දෙන්න.

(ලකුණු 04)

03. එක්තරා පොහොර නිෂ්පාදන සමාගමක් නයිට්‍රේට් නිෂ්පාදන කිරීමේ කෙටි කාලීන පිරිවැය ශ්‍රිතය $S$ - හැඩයක් ගන්නා බව සංඛ්‍යානමය අධ්‍යයන මඟින් හෙළිකර ගනී. එය පිරිවැය න්‍යාය මඟින් පෙන්වා දෙන ප්‍රස්තුතයන් සමඟ අනුකූල වේ. මේ අනුව සමාගමේ මුළු පිරිවැය ශ්‍රිතය පහත සඳහන් ස්වරූපය ගනියි.

$$TC = 300 + 50Q - 10Q^2 + Q^3$$

මෙහි $Q$ සංකේතයෙන් අදහස් කෙරෙන්නේ පැයක දී නිෂ්පාදනය කෙරෙන නයිට්‍රේට් මෙට්‍රික් ටොන් ප්‍රමාණයයි.

(අ) ස්ථාවර පිරිවැය ගණනය කරන්න. සාමාන්‍ය මුළු පිරිවැය (ATC), මුළු විචල්‍ය පිරිවැය (TVC), සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) සහ ආන්තික පිරිවැය (MC) සඳහා අදාළ සමීකරණ ව්‍යුත්පන්න කරන්න.

(ලකුණු 05)

(ආ) සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය U - හැඩයක් ගන්නා බවත් ආන්තික පිරිවැය වක්‍රය සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යයේ දී එකිනෙක ඡේදනය වන බවත් පෙන්වා දෙන්න.

(ලකුණු 05)

(ඇ) සාමාන්‍ය විචල්‍ය පිරිවැය අවම වීම සඳහා පැයක දී නිෂ්පාදනය කළ යුතු නයිට්‍රේට් මෙට්‍රික් ටොන් ප්‍රමාණය කොපමණ විය යුතු ද? එම නිමවුමේ දී සාමාන්‍ය විචල්‍ය පිරිවැය කොපමණ ද?

(ලකුණු 05)

04. විවිධ වෙළෙඳ ව්‍යුහයන් යටතේ හටගන්නා දිගුකාලීන සමතුලිතයන්හි දී කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් ඇගවෙන දෑ පහත සඳහන් ශීර්ෂයන් යටත් සසඳන්න.

(අ) මුළු ලාභ

(ආ) දිගුකාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රයේ නිෂ්පාදන ලක්ෂ්‍යය

(ඇ) සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාව සහ

(ඈ) අලෙවි ප්‍රවර්ධනය

(ලකුණු 15)

## (ආ) කොටස

05. අදාළ අවස්ථාවන්හි දී රූප සටහන් සහ උදාහරණ භාවිත කරමින් පහත සඳහන් ප්‍රකාශ පැහැදිලි කරන්න.

(අ) "සාමාන්‍යයෙන් වෙළෙඳපොළ ඉල්ලුම් වක්‍රයක් වමේ සිට දකුණට ඉහළ නගින රේඛාවක් වන නමුත් පූර්ණ තරග වෙළෙඳපොළ ව්‍යුහය තුළ අඩුවන පිරිවැය කර්මාන්තයන් හි දිගුකාලීන සැපයුම් වක්‍රය වමේ සිට දකුණට පහළ බසින රේඛාවකි."

(ලකුණු05)

(ආ) "මිල විශේෂණය පාරිභෝගිකයාට අහිතකර ය. එහෙත් මිල විශේෂණය පාරිභෝගිකයාට හිතකර වන අවස්ථා ද ඇත."

(ලකුණු05)

(ඇ) "ඒකාධිකාරී තරග ආයතනයක දිගුකාලීන සමතුලිතයේ දී මිල සාමාන්‍ය පිරිවැයට සමාන වන නමුත් එම අවස්ථාවේ දී ද ආර්ථික කාර්යක්ෂමතාව පිළිඹිබු නොවේ."

(ලකුණු05)

06. (අ) එකතුව ශූන්‍ය ක්‍රීඩාව යන්න හඳුන්වා දී කල්පිත උදාහරණයක් ඇසුරින් ආයතන දෙකක් වෙළෙඳපොළ අල්ලා ගැනීමට තරග කිරීමේ දී ප්‍රශස්ත ක්‍රමෝපාය තෝරාගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු05)

(ආ) A සහ B යනු දුම්වැටි නිෂ්පාදන කර අලෙවි කරන ආයතන දෙකකි. වෙළෙඳපොළ තුළ ප්‍රචාරණය කිරීම හෝ නොකිරීමේ අවස්ථාව ඔවුන් සතු වේ. පහත දැක්වෙන්නේ ප්‍රචාරණය කිරීම හා නොකිරීම තුළින් ඔවුන් ලබන ලාභයයි. (ඔවුන්ගේ ගෙවුම් න්‍යාසයයි.) ඒ අනුව ආයතන දෙකට ම නිශ්චිත ක්‍රමෝපායක් තිබේ ද? නොඑසේ නම් නැෂ් සමතුලිතය තිබේ දැයි පැහැදිලි කරන්න.

| B ආයතනය | | A ආයතනය | |
|---|---|---|---|
| | | ප්‍රචාරණය නොකිරීම | ප්‍රචාරණය කිරීම |
| | ප්‍රචාරණය නොකිරීම | $\pi_A$: 500 | $\pi_A$: 750 |
| | | $\pi_B$: 400 | $\pi_B$: 0 |
| | ප්‍රචාරණය කිරීම | $\pi_A$: 0 | $\pi_A$: 300 |
| | | $\pi_B$: 300 | $\pi_B$: 200 |

(ලකුණු05)

(ඇ) "නැමුණු ඉල්ලුම් වක්‍ර විග්‍රහය කතිපයාධිකාරය තුළ මිල දැඩියාවක් ඇතැයි තහවුරු කරයි." නැමුණු ඉල්ලුම් වක්‍රයක් නිර්මාණය වීමට තුඩුදෙන හේතු ඉදිරිපත් කරමින් ඉහත සඳහන් ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු05)

07. (අ) නිෂ්පාදන සාධකයක සම්පූර්ණ ඉපයීම ආර්ථික බදුකුළිය වන අවස්ථාවක් රූප සටහන් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු05)

(ආ) "ආන්තර බදුකුලිය භූමියේ සාරවත් බවේ වෙනස මත උපයන ඉපයීමකි." කල්පිත උදාහරණයක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු04)

(ඇ) "භාණ්ඩ වෙළෙඳපොළෙහි අපූර්ණ තරගය පැවතීම ශ්‍රමයට කරනු ලබන ගෙවීම අසාධාරණ එකක් වීමට හේතු වන අතර ශ්‍රම වෙළෙඳපොළෙහි අපූර්ණ තරගය පැවතීම එම අසාධාරණය තීව්‍ර කරන්නට හේතු වේ." මෙම ප්‍රකාශය පැහැදලි කරන්න.

(ලකුණු06)

08. (අ) "වෙළෙඳපොළ අසමත් වීම" යන්න අර්ථ දක්වන්න.

(ලකුණු04)

(ආ) පරිභෝජනයේ ධන බාහිරතා ඇති අවස්ථාවක් වෙළෙඳපොළ අසමත් වීමට තුඩුදෙන ආකාරය විස්තර කර එවැනි තත්ත්වයක් නිවැරදි කිරීම උදෙසා රජයකට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ලකුණු05)

(ඇ) පොදු සමතුලිත අවස්ථාවේ දී නිෂ්පාදනයේ හා පරිභෝජනයේ පැරටෝ ප්‍රශස්ථ තත්ත්වය ඇතිවන ආකාරය විස්තර කරන්න.

(ලකුණු06)

@@@@@@@@